# දෙවැනි පරිච්ඡේදය

## 2. සංකල්ප හා අර්ථ දැක්වීම

### 2.1 ආර්ථික සංගණනය

ශ්‍රී ලංකාවේ දේශ සීමාව තුළ ක්‍රියාත්මක වන සියලුම ආර්ථික කටයුතුවල නියුතු ඒකකයන් ආවරණය වන පරිදි නියම කරනු ලබන කාලසීමාවක් තුළ කෘෂිකර්ම, කර්මාන්ත, වෙළෙඳ හා සේවා කටයුතුවල තොරතුරු රැස් කිරීම, ගොනු කිරීම, ඇගයීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීමේ හෝ බෙදා හැරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය "ආර්ථික සංගණනය" ලෙස හැඳින් වේ.

### 2.2 ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම

තොරතුරු එක්රැස් කිරීමේ ඒකකය ලෙස ගොවිකාණ්ඩය පදනම්ව, කෘෂිකාර්මික ව්‍යුහයට අදාළ ප්‍රමාණාත්මක තොරතුරු, එක් වගා වර්ෂයක් තුළදී රාජ්‍ය අනුග්‍රහය සහිතව, දීපව්‍යාප්තව එක්රැස් කිරීමේ ක්‍රියාවලිය "කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම" ලෙස හැඳින්වේ.

### 2.3 සංගණන කාණ්ඩය

2012 වර්ෂයේ පවත්වන ලද ජන හා නිවාස සංගණනයේදී ග්‍රාමීය ප්‍රදේශවල නිවාස හා ගොඩනැගිලි ඒකක 150ක පමණ ප්‍රමාණයකින් සමන්විත වන පරිදි හා නාගරික ප්‍රදේශවල ඒකක 200ක පමණ ප්‍රමාණයකින් සමන්විත වන පරිදි ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද මායිම්වලින් වෙන් කොට දැක්වූ භූමි ප්‍රදේශයක් " සංගණන කාණ්ඩය"ලෙස හැඳින්වේ.

### 2.4 නිවාස ඒකකය, සමූහ වාසස්ථානය හා වාසය සඳහා නොවන ස්ථානය

මිනිසුන්ගේ වාසය සඳහා වූ ද වෙනත් වාසස්ථානවලින් වෙන් වූ ද ඇතුළුවීම/ පිටවීම සඳහා වෙනම භාවිතා කළහැකි දොරටුවක් තිබෙන්නා වූ ද ගොඩනැගිල්ලක්, "නිවාස ඒකකය" ලෙස හැඳින්වේ.

නිවාස ඒකකයක් වීමට,

1. මිනිසුන්ගේ වාසය සඳහා වූ ස්ථානයක් වීම
2. වෙනත් ස්ථානවලින් වෙන් වී තිබීම
3. ඇතුළුවීම/ පිටවීම සඳහා වෙනම දොරටුවක් තිබීම යන

ඉහත ලක්ෂණ සියල්ලම සම්පූර්ණ විය යුතුය.

පොදු අරමුණක් වෙනුවෙන් සාමාන්‍යයෙන් එකිනෙකට නෑකමක් නැති පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් පදිංචිව සිටින ස්ථානයක් "සමූහ වාසස්ථානය" ලෙස හැඳින්වේ.

නිවාස ඒකකයක් හෝ සමූහ වාසස්ථානයක් හෝ නොවන ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් හෝ ඇතැම්විට ගොඩනැගිලි සමූහයක් "වාසය සඳහා නොවන ස්ථානය" ලෙස හැඳින්වේ.

## 2.5 ගෘහ කාණ්ඩය

එක් පුද්ගලයෙකු තනිව වෙසෙමින් තමාගේ ආහාර පාන ඔහුම පිළියෙල කර ගන්නේ නම් හෝ පුද්ගලයින් සමූහයක් එකට වාසය කරමින් තමන්ගේ ආහාර පාන එක්ව පිළියෙල කර ගන්නේ නම්, ඔහු හෝ එම පුද්ගලයින් සමූහය "ගෘහ කාණ්ඩය"ලෙස හැඳින්වේ.

* ගෘහ කාණ්ඩ ඇත්තේ නිවාස ඒකකවල පමණි. සමූහ වාසස්ථානවල සහ වාසය සඳහා නොවන ස්ථානවල ගෘහ කාණ්ඩ නොමැත.

* ගෘහ කාණ්ඩයක සාමාජිකයන් බොහෝ විට එකිනෙකාට නෑකම් ඇති අය වේ. සමහරවිට නෑකම් නැති අය ද සිටිය හැකි ය.

* ගෘහ කාණ්ඩයක සාමාජිකයන් පවුලක් ම විය යුතු නැත. මව්පියන් හා දරුවන් පමණක් නොව පවුලෙන් බාහිර අය ද සිටිය හැකි ය. එනම් නෑදෑයින්, මෙහෙකරුවන් ආදිය යි. ඔවුන් පවුලේ සාමාජිකයින් හා පොදුවේ ආහාරපාන ගැනීම සඳහා කටයුතු සලසා ගෙන ඇත්නම් ඒ සියලු දෙනාම එකම ගෘහ කාණ්ඩයට අයත් වේ.

* කෙසේ නමුත් මෙහි ස්ථිර පදිංචි නැති (පවුලෙන් බාහිර) පුද්ගලයින් ගෘහ කාණ්ඩයේ ස්ථිර පදිංචි පුද්ගල ගණනින් බැහැර කර ඇත.

* සෑමවිට ම නිවාස ඒකකවල පදිංචි පුද්ගලයින් ගණන් ගැනීමේ දී ගෘහ කාණ්ඩ වශයෙන් ගණන් ගත යුතුවන අතර, එක් නිවාස ඒකකයක ගෘහ කාණ්ඩ එකකට වඩා තිබෙන අවස්ථා ද ඇත.

## 2.6 ගොවිකාරකයා, උප ගොවිකාරකයා

- කෘෂිකාර්මික බෝග වගා කිරීම
- මස්, කිරි හෝ බිත්තර නිෂ්පාදනය සඳහා සතුන් ඇති කිරීම
- මිරිදිය/ කිවුල්දිය (කලපු) / කරදිය ජලජීවීන් වගා කිරීම

පිළිබඳ වගකීම් දරමින් එකී කටයුතු එකක් හෝ කිහිපයක් සම්බන්ධව ගෘහ කාණ්ඩය/ ආයතනය (මතු විස්තර කෙරෙන ගොවි කාණ්ඩය) තුළ ප්‍රධාන තීරණ ගන්නා තැනැත්තා "ගොවිකාරකයා" ලෙස හැඳින්වේ.

මෙහිදී ඔහු / ඇය ඉහත කටයුත්තක් හෝ කටයුතු,

* තමා විසින් කරන්නකු හෝ
* අන් අයගේ සහාය ඇතිව කරන්නකු හෝ

* එම කටයුතුවලට අදාලව කායික වැඩක් නොකර ඒවා මෙහෙයවමින් තීරණ ගන්නා තැනැත්තෙකු හෝ විය හැකි ය.

ඒ අනුව,

* ගොවිකාරකයෙක් ස්වකීය වගා කටයුතු/ සත්ත්ව පාලනය/ ජලජීවී වගාව වෙන් වෙන් වශයෙන් හෝ සියල්ලම හෝ තමාම කරන්නකු විය හැකි ය.
* එසේත් නැතිව කෘෂිකර්මයට අදාළ කායිකව වැඩ නොකර එම කටයුතු මෙහෙයවන්නෙකු පමණක් ද විය හැකි ය.
* ඔහු ඉඩම් හෝ කෘෂිකාර්මික සතුන් හෝ ජලජීවී වගාවන් අයිතිකරුවකු හෝ නොවිය හැකි ය. එනම් හිමිකම කාරකත්වය සඳහා සුදුසුකමක් නොවන අවස්ථාවකි.
* ගොවිකාරකයකු වීමට ඔහු තම ශ්‍රමය යොදා ඉඩම් වගා කිරීම, කෘෂිකාර්මික සතුන්ගේ (කිරි දෙවීම, තණ කැවීම වැනි) එදිනෙදා කටයුතු, ජලජීවී වගාව ආශ්‍රිත එදිනෙදා කටයුතුවල නියැලී සිටීම අවශ්‍ය නොවිය. ඉඩම් වගා කිරීම, සතුන් ඇති කිරීම, ජල ජීවී වගා කටයුතු යන අංශ එකක හෝ කිහිපයක එදිනෙදා තීරණ ගැනීම ප්‍රමාණවත් විය.

- "ගොවිකාරකයා" ගොවි කාණ්ඩයක ප්‍රධානියා ය.
- කෘෂිකාර්මික කටයුතු මෙහෙයවීම පිළිබඳ ප්‍රධාන ආර්ථික හා තාක්ෂණික වගකීම ඔහු සතු ය.

ඒ අනුව,

i. සංගණන ඒකකයක ගොවිකාරකයින් කිහිපදෙනෙක් සිටිය හැකි ය.
ii. එක් ගොවි කාණ්ඩයක සිටිය හැක්කේ එක් ගොවිකාරකයෙකු පමණි.

"උප ගොවිකාරකයා" යනුවෙන් හැඳින්වෙන්නේ තමාගේ ම වැඩ කරන කාරක තත්ත්වයක් සහිත (මතු විස්තර කෙරේ) ගොවි කාණ්ඩයක් තුළ ගොවිකාරකයාට අමතරව එම ගොවි කාණ්ඩය වෙනුවෙන් ම කෘෂිකාර්මික කටයුතු මෙහෙයවීම සඳහා එදිනෙදා තීරණ ගන්නා වෙනත් සාමාජිකයින්ය.

- උප ගොවිකාරකයා ද ගොවි කාණ්ඩයේ කිසියම් කටයුත්තක් හෝ කටයුතු කිහිපයක් සම්බන්ධව සක්‍රීයව තීරණ ගන්නෙකු වේ.
- එහෙත් ඔහු ගොවි කාණ්ඩය පිළිබඳව ප්‍රධාන ආර්ථික හෝ තාක්ෂණික තීරණ ගන්නා නොවේ.
- උප ගොවිකාරකයා ඇතැම් විට ඉඩම් කැබැල්ලක කොටසක්, එක් ඉඩම් කැබැල්ලක්, ඉඩම් කැබලි සියල්ලම හෝ සත්ත්ව පාලන කටයුතු, ජලජීවී වගා කටයුතු මෙහෙය වන්නා විය හැකිය.

ඒ අනුව,

i. උප ගොවිකාරකයින් සිටිය හැක්කේ තමාගේම වැඩකරන කාරක තත්ත්වයක් සහිත ගොවි කාණ්ඩයක පමණි.
ii. තමාගේම වැඩකරන කාරක තත්ත්වයක් සහිත ගොවි කාණ්ඩයක උප ගොවි කාරකයින් කිහිපදෙනෙකු සිටිය හැකි ය.
iii. පවුලේ සාමාජිකයන් කෘෂිකාර්මික කටයුතුවලට උදව් වූ පමණින් ඔවුන්ව උප ගොවිකාරකයින් ලෙස හැඳින්විය නොහැකි ය.
iv. කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැටුප් ලබන සේවකයින් (කම්කරුවන්) උප ගොවිකාරකයින් ලෙස සැළකිය නොහැකිය.

කුඩා ගොවි කාණ්ඩයක ගොවිකාරකයෙකු වීමට කෘෂිකාර්මික නිෂ්පාදනයක් සම්බන්ධ තීරණ ගන්නෙක් විය යුතුම ය. එබැවින් පහත කාර්යයන්හි නිරත වීම ගොවිකාරකයෙකු වීමට සුදුසු කමක් නොවේ.

I. ජංගම පැළ තවාන් කරුවකු ලෙස රථයක/ අට්ටාලයක පැළ වෙළෙඳාම් කිරීම
II. මල්/ විසිතුරු පැළ වගාවෙහි නිරතව සිටීම
III. දැවමය ශාක (වන) වගා කරුවකු වීම
IV. විනෝදාශයක් වශයෙන් සතුන් ඇති කිරීම
V. විනෝදාංශයක් වශයෙන් විසිතුරු මසුන් ඇති කිරීම

## 2.7 කාරක තත්ත්වය

කාරක තත්ත්වය ආකාර 4 කි.

- තමාගේම වැඩ කරන
- වෙනත් අය සමඟ හවුලේ
- පුද්ගලික අය වෙනුවෙන්
- ආයතනයක් වෙනුවෙන්

* එක් ගොවිකාරකයෙකුට මෙම කාරක තත්ත්ව කිහිපයක් යටතේ වෙනස් ගොවි කාණ්ඩ කිහිපයක් තිබිය හැකි ය.

* එනම් කාරක තත්ත්වය වෙනස් වූ විට එය වෙනම ගොවි කාණ්ඩයක් බවට පත් වේ.

- **තමාගේම වැඩ කරන**

වෙනත් කිසිම පුද්ගලයෙකුට හෝ ආයතනයකට වගකීමක් හෝ සම්බන්ධයක් නොමැතිව ගොවි කාණ්ඩයට අදාළ සියලුම තීරණ ගන්නා පුද්ගලයකු එකී ගොවි කාණ්ඩයට අදාළව "තමාගේම වැඩ කරන" කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

* ඔහු/ ඇය කම්කරුවන් හෝ සිය පවුලේ අය කෘෂිකර්ම වැඩ කටයුතු සඳහා යොදාගෙන තිබිය හැකි ය.

* අඳයට, බද්දට හෝ වී පොරොන්දුව පිට වී වගා කරන්නන් ද මේ යටතට ගැනේ.

- **වෙනත් අය සමඟ හවුලේ**

ගොවි කාණ්ඩයේ කටයුතු පිළිබඳ එදිනෙදා තීරණ ගැනීම හා වගකීම් දැරීම තවත් එක් අයකු හෝ කීපදෙනෙකු සමඟ සිදු කරයි නම් එම පුද්ගලයා එකී ගොවිකාණ්ඩයට අදාළව "වෙනත් අය සමග හවුලේ" කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

- **පුද්ගලික අය වෙනුවෙන්**

ගොවි කාණ්ඩයක කළමනාකරුවකු/ පාලකයකු/ භාරකරුවකු වශයෙන් පුද්ගලයෙකු හෝ කීපදෙනෙක් වෙනුවෙන්, වැටුපක්/ ප්‍රතිලාභයක් ලබා ගෙන, වගකීම හා පාලනය දරන්නේ නම් එම පුද්ගලයා එකී ගොවි කාණ්ඩයට අදාළව "පුද්ගලික අය වෙනුවෙන්" කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

- **ආයතනයක් වෙනුවෙන්**

රජයේ හෝ අර්ධ රජයේ හෝ රජයේ අනුග්‍රහය ලබන සංවිධානයක්, පුද්ගලික ආයතනයක් වෙනුවෙන් වැටුප්/ ප්‍රතිලාභ ලබමින් ගොවි කාණ්ඩයක් මෙහෙයවන්නේ නම් එම පුද්ගලයා එකී ගොවි කාණ්ඩයට අදාළව "ආයතනයක් වෙනුවෙන්" කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

## 2.8 ගොවි කාණ්ඩය

එක් ගොවිකාරක තත්ත්වයක් යටතේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සම්පූර්ණව හෝ කොටස් වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සියලුම ගොඩ/ මඩ ඉඩම්/ සත්ත්ව පාලන කටයුතු/ ජලජීවී වගා කටයුතු සිදු කරන ඒකක"ගොවි කාණ්ඩය" ලෙස හැඳින්වේ.

මේ අනුව,

* ගොවි කාණ්ඩයක් බිම් කැබලි එකකින් හෝ කිහිපයකින් සමන්විත විය හැකි ය.
* එම බිම් කැබලි එකම පරිපාලන බල ප්‍රදේශයක් තුළ හෝ වෙනස් පරිපාලන බල ප්‍රදේශවල හෝ විසිරී තිබිය හැකි ය.
* ගොවිකාරකයාට එහි අයිතිය තිබිය හෝ නොතිබිය හැකි ය.
* ඒවා නිත්‍යානුකූලව හෝ අනවසරයෙන් වැඩ කරන කැබලි විය හැකි ය.
* ගොවි කාණ්ඩයේ බිම් ප්‍රමාණය (විශාලත්වය) කුමන හෝ ප්‍රමාණයක් විය හැකි ය.
* ගොවි කාණ්ඩයක් මඩ ඉඩම්වලින් පමණක් හෝ ගොඩ ඉඩම්වලින් පමණක් හෝ ගොඩ හා මඩ ඉඩම් යන දෙවර්ගයෙන් ම සමන්විත විය හැකි ය.
* ගොවි කාණ්ඩයක් බෝග වගාවලින් පමණක්, සත්ත්ව පාලනයකින් පමණක්, ජල ජීවී වගා කටයුතුවලින් පමණක් හෝ ඉන් කිහිපයක සංකලනයක් ලෙසින් හෝ සමන්විත විය හැකි ය.

## 2.9 භුක්තිය

කාරකයා ගොවිකාණ්ඩයේ කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය යොදවා ගන්නා නීත්‍යානුකූල හෝ නීත්‍යානුකූල නොවන ස්වරූපය "භුක්තිය" ලෙස හැඳින් වේ.

කුඩා ගොවිකාණ්ඩ තොරතුරු රැස්කිරීම සඳහා භුක්තිය ආකාර හතකින් දැක්විය හැකි ය.

1) තනි අයිතිය
ගොවිකාරකයාට හෝ ගොවිකාරකයාගේ පවුලේ සාමාජිකයකුට අයිති ඉඩම් මේ යටතට ගැනේ. මේවා ප්‍රවේණි හා සින්නක්කර ඉඩම් වේ.

2) බල පත්‍රයක් යටතේ
බලපත්‍රයක් යටතේ භුක්ති විඳීම යනු එල්.ඩී.ඕ./ සී.එල්.ඕ./ එල්.ආර්.සී. දීමනා, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර, ජනපද ව්‍යාපාර යටතේ රජයෙන් බදු හෝ අවසර පත් ලැබීම මගින් භුක්ති විඳීම සැලකේ. ස්වර්ණ භූමි, ජය භූමි, වැනි වැඩ සටහන් මගින් බලපත්‍ර/ ලබා දී ඇති ඉඩම් ද මෙයට ඇතුලත් වේ.

3) අඳයට/ බද්දට

වගා අස්වැන්නෙන් පංගුවක් හෝ ඒ වෙනුවෙන් මුදල් දීමෙන් වගා කෙරෙන ඉඩම් අඳයට හෝ බද්දට ගත් භුක්ති විඳීමක් ලෙස සැලකේ.

4) හවුල් අයිතිය

හවුල් අයිතියක් ඇති වන්නේ එක් පුද්ගලයෙකුට වඩා වැඩි අයිතිකරුවන් ප්‍රමාණයන් සිටින අවස්ථාවකය. තට්ටු මාරු, කට්ටි මාරු ක්‍රමයට භුක්ති විඳීමින් වගා කරන බිම්ද මේ යටතට ගැනේ.

5) බෙත්ම ක්‍රමය

බෙත්ම ක්‍රමය යනු ගොවි කාණ්ඩ/ වගා බිමට ජලය සැපයීම මත පදනම් වූ ක්‍රමයකි. කිසියම් කුඹුරු යායක කන්නයකදී නිකුත් කරනු ලබන ජල ප්‍රමාණය සීමිත නිසා එම යායේ වගා කරනු ලබන බිම් ප්‍රමාණයට වඩා අඩු බිම් ප්‍රමාණයක් යායට අදාළ ගොවීන් අතර මුල් බිම් ප්‍රමාණයේ අනුපාතයට බෙදා දී බෝග වගා කරනු ලබන විට ඇතුළත් වන භුක්ති ක්‍රමය වේ. මෙහිදී තමාගේ කුඹුරෙන් කොටසක් වෙනුවට වෙනත් අයෙකුගේ කුඹුරකින් කොටසක් ලැබිය හැකි ය.

6) අනවසර

ගොවි කාරකයාට හෝ පවුලේ සාමාජිකයකුට කිසිම අයිතියක් නැතිව භුක්ති විඳින ඉඩම් අනවසර භුක්තිය යටතට ගැනේ. රජයේ බිම්/ රක්ෂිත බිම් ආදිය භුක්ති විඳීම ද මෙයට අයත් වේ.

7) වෙනත්

ඉහත විස්තර කළ කිසිදු කාණ්ඩයකට ඇතුලත් කළ නොහැකි බිම් කැබලි වෙනත් අයුරකින් භුක්ති විඳින යටතට දැක්විය හැකිය. ඒ අනුව මුදලින් හෝ අස්වැන්නෙන් ගෙවීම් නොකර කාරකත්වය දරණ පෞද්ගලික බිම් කැබලි මෙයට ඇතුලත් වේ.

## 2.10 බිම් කැබැල්ල

ගොවි කාණ්ඩයට අයත් බිම් කොටසක්, එම ගොවි කාණ්ඩයට අයත් නොවූ බිමකින්, ජල මාර්ගයකින්, පාරකින්, කැලෑවකින් හෝ වෙනත් භුක්තියක් සහිත ඉඩමකින් සම්පූර්ණයෙන්ම මායිම්ව ඇත්නම් එය “බිම් කැබැල්ල” ලෙස හැඳින්වේ.

* භුක්තිය වෙනස්නම් එකට යාව පිහිටන බිම් කොටස් වෙන වෙන ම ඉඩම් කැබලි ලෙස සැලකේ.
* එකම භුක්තිය යටතේ එකිනෙකට යාව පිහිටි බිම් කොටස් කිහිපයක් එකම කැබැල්ලක් ලෙස සැලකේ.

ඉඩමක ස්වභාවය අනුව හෝ එහි වගා කරනු ලබන බෝග වර්ග අනුව හෝ බිම් කැබැල්ලක් වෙන්කර දැක්විය නොහැකිය.

## 2.11 ගොවිකාණ්ඩයේ මුළු බිම් ප්‍රමාණය

සියලුම වගා කළ හා වගා නොකළ, භෞතික වශයෙන් නිශ්චය කරන ලද බිම් ප්‍රමාණයන්ගේ එකතුව "ගොවි කාණ්ඩයේ මුළු බිම් ප්‍රමාණය" ලෙස හැඳින්වේ.

* ගොවි කාණ්ඩයක් සියලුම ගොඩනැගිලි, ගල්තලා, ලඳු කැලෑ ආදියට යටවී ඇති බිම් ප්‍රමාණයන්ගෙන් ද, වගා කරන ලද හෝ වගා නොකරන ලද ගොඩ හා මඩ ඉඩම්වලින් ද සමන්විත වේ.

* මෙය ගොවි කාණ්ඩයේ "ශුද්ධ බිම් ප්‍රමාණය" ලෙස ද හැඳින් වේ.

මුළු බිම් ප්‍රමාණය සැළකීමේ දී ගොවිකාරකයා විසින් පාලනය හා වගකීම දරන,

- ඔහුටම අයත්,
- අන් අයගෙන් බද්දට ගෙන ඇති,
- වෙනස් භුක්ති ක්‍රමයන් යටතේ ඇති,
- එම ගොවි කාණ්ඩයේ පිහිටි සියලුම ගොඩනැගිලිවලට යටව ඇති,

සම්පූර්ණ බිම් ප්‍රමාණය ඇතුළත් විය යුතු ය.

## 2.12 ශුද්ධ බිම් ප්‍රමාණය, දළ බිම් ප්‍රමාණය

කිසියම් බිම් කැබැල්ලක හෝ ඉඩමක භෞතික වශයෙන් නිශ්චය කරන ලද බිම් ප්‍රමාණය "ශුද්ධ බිම් ප්‍රමාණය" ලෙස හැඳින්වේ.

ශුද්ධ බිම් ප්‍රමාණයක් තුළ බෝගයන් යටතේ වගා කොට ඇතැයි ඇස්තමේන්තු කරන ලද බිම් ප්‍රමාණය "දළ බිම් ප්‍රමාණය " ලෙස හැඳින්වේ.

එහිදී බිම් ප්‍රමාණය නිශ්චය කරනු ලබන්නේ,

- අක්කරයට නියමිත පදනමක් මත වගා කොට ඇති ගස්/ වැල්/ පඳුරු ගණන අනුව හෝ,
- අක්කරයක් සඳහා සාමාන්‍යයෙන් ඒ ඒ බෝග යටතේ වැපිරීම හෝ සිටුවීම සඳහා යොදාගත් බීජ ප්‍රමාණයට අනුරූපී අන්දමින් බිම් ප්‍රමාණය ගණනය කිරීමෙනි.

එහෙත් මෙහිදී,

- බිම් ප්‍රමාණය මිනුම් පටියෙන් මැන නිශ්චයකර නොමැතිවීමට පිළිවන.

තවද,

එක් බිම් කැබැල්ලක්/ ඉඩමක් තුළ මිශ්‍ර අන්දමින් බෝග කිහිපයක් වගා කර ඇත්නම් දළ බිම් ප්‍රමාණය වශයෙන් එකී බෝග යටතට ඇස්තමේන්තු කරන ලද බිම් ප්‍රමාණයන්ගේ එකතුව ගත් විට ශුද්ධ බිම් ප්‍රමාණයට සමාන නොවී ඊට අඩු හෝ වැඩි හෝ විය හැකි ය.

## 2.13 ගෙවත්ත

I. පර්චස් 20කට සමාන හෝ ඊට අඩු ඉඩම් කැබැල්ලක ගොවි කාරකයා පදිංචි නිවසක් සහිතව නිවසේ පරිභෝජනය සඳහා හෝ වෙළෙඳපොළ සඳහා කෘෂිකාර්මික නිෂ්පාදනයක් (බෝග වගාව, සත්ත්ව පාලනය, ජල ජීවී වගාව ආශ්‍රිතව) සිදුවේ නම් එය ද,

II. පර්චස් 20 කට වැඩි ඉඩම් කැබැල්ලක ගොවිකාරකයා පදිංචි නිවසක් සහිතව වැඩි ප්‍රමාණයක් නිවසේ පරිභෝජනය සඳහා කෘෂිකාර්මික නිෂ්පාදනයක් (බෝග වගාව, සත්ත්ව පාලනය,ජල ජීවී වගාව ආශ්‍රිතව) සිදුවේ නම් එය ද, "ගෙවත්ත" ලෙස හැඳින්වේ.

පදිංචි නිවසක් සහිත බිම් කැබැල්ලක් ගෙවත්තක් වන සහ නොවන අවස්ථා කිහිපයක් පහත පරිදි පෙන්වා දිය හැකි ය.

| ගෙවත්තක් වීම | ගෙවත්තක් නොවීම |
|---|---|
| 1. ගොවිකාරකයා පදිංචි නිවස සහිත පර්චස් 19ක ඉඩමෙහි තේ වගා කර ඇති අතර දළු අස්වැන්න අලෙවි කරයි. | 1. ගොවිකාරකයා පදිංචි නිවස සහිත පර්චස් 35ක ඉඩමෙහි ලොකු ළූණු වගා කර ඇති අතර නිෂ්පාදනයෙන් වැඩි කොටස විකිණීම සඳහාය. |
| 2. ගොවිකාරකයා පදිංචි නිවස සහිත අක්කර 2ක ඉඩම ස්ථිර බෝග කිහිපයකින් සහ කාලීන බෝග වගාවකින් යුතු වුව ද කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටස නිවසේ පරිභෝජනය සඳහාය. | 2. ගොවිකාරකයා පදිංචි නිවස සහිත අක්. 2 ක ඉඩමෙහි ගම්මිරිස්, කෝපි සහ තවත් කාලීන බෝග කිහිපයක් වගා කර ඇති අතර වැඩි කොටස විකිණීම සඳහා වේ. |

(ගොවිකාරකයා පදිංචි නිවසක් නොතිබේ නම් එම බිම් ප්‍රමාණය කිසි විටෙකත් ගෙවත්තක් ලෙස හඳුනා නොගනී.)

## 2.14 කෘෂිකාර්මික වැඩකටයුතු

ගොවි කාණ්ඩයක බෝග වගා කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සතුන් ඇති කිරීම, ජල ජීවී වගාව යන සෑම කටයුත්තක්ම සහ ඒ හා සම්බන්ධිත කටයුතු "කෘෂිකාර්මික වැඩ කටයුතු" ලෙස හැඳින්වේ.

ඔහුගේ ගොවි කාණ්ඩයට සම්බන්ධව,

- කය වෙහෙසා කරන වැඩ
- ගොවිපලේ සැලසුම් සම්පාදනය / ගිණුම් තැබීම ආදී කාර්යයන්
- ගොවිපලෙන් පිටතදී කෙරෙන රසායනික පොහොර, කෘමි නාශක ආදිය මිලදී ගැනීම හෝ ප්‍රාථමික නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි කිරීම ආදිය කෘෂිකාර්මික වැඩ කටයුතු වේ.

## 2.15 කුඩා ගොවි කාණ්ඩය

අක්කර 20ට අඩු බිම් කැබලි සහිත සියලුම කෘෂිකාර්මික ඒකක "කුඩා ගොවි කාණ්ඩය" ලෙස හැඳින්වේ.

## 2.16 යොමු කාලය

තොරතුරු එකතුකර ගැනීම සඳහා පාදක කරගන්නා කාලය ආර්ථික සංගණනයේ "යොමු කාලය ලෙස" හැඳින්වේ.

ආර්ථික සංගණයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමට අදාල යොමු කාලය ලෙස සාමාන්‍යයෙන් මාස 12 ක කාලසීමාවක් සලකනු ලබයි.

## 2.17 "වත්ත"අර්ථ දැක්වීම

එකම කාරක තත්ත්වයක් යටතේ හා එකම භුක්තියක් යටතේ වන සේ භූමි ප්‍රමාණයකින් අවම වශයෙන් එක් බිම් කැබැල්ලක්වත් අක්කර 20ක් හෝ ඊට වඩා වැඩි වන්නේ නම් එම ගොවි කාණ්ඩය වත්තක් ලෙස සලකනු ලැබේ. මෙහිදී වත්තේ සේවය කරනු ලබන කම්කරුවන්ගේ ප්‍රමාණය පිළිබඳව සැලකිල්ලට ගනු නොලැබේ.

### I. එකම කාරක තත්ත්වය

වත්ත යන්න නිර්වචනය කිරීමේදී කාරක තත්ත්වයට විශේෂ ස්ථානයක් හිමිවන අතර වතු ඇසුරින් ප්‍රධාන වශයෙන්ම කාරක තත්ත්වයන් 4 ක් හඳුනාගත හැකිය. එනම්,

- තමා විසින්ම වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්
- රජයේ ආයතනයක්, වෙළෙඳ සමාගමක් හෝ කළමනාකරණ නියෝජිත ආයතනයක් වෙනුවෙන් වැඩකටයුතු මෙහෙයවන අධිකාරී, කොන්දොස්තර වැනි වැටුප් ලබන සේවකයන්
- පුද්ගලික අයෙකු හෝ පිරිසක් වෙනුවෙන් වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්
- තවත් හවුල්කරුවන් සමඟ වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්

වත්තක් වීම සඳහා ඉහත සඳහන් කරන ලද කාරක තත්ත්වයන් ඇසුරින් එකම කාරක තත්ත්වයක එම වත්ත හෝ එහි කොටස් පැවතිය යුතුය.

### II. එකම භුක්තිය

යම් පුද්ගලයෙකුට හෝ ආයතනයකට භූමිය අයිතිව ඇති අවස්ථාවක එම පුද්ගලයා හෝ ආයතනය මෙන්ම වෙනත් පුද්ගලයෙකු හෝ ආයතනයක් එම භූමිය තුළ වගා කටයුතු, සත්ත්ව පාලන කටයුතු කරමින් එහි අස්වැන්න හෝ නිෂ්පාදනය ලබා ගනී නම් එය එම භූමිය භුක්ති විඳීම වන අතර එය භුක්තිය ලෙස හඳුන්වයි.

වත්තක් තුළදී මෙම භුක්තිය ප්‍රධාන වශයෙන් ස්වරූප 6 ක් යටතේ හඳුනාගත හැකිය. එනම්,

- රජයේ
- අර්ධ රජයේ
- වැවිලි සමාගම්
- පුද්ගලික සමාගම්
- තනි පුද්ගල
- පුද්ගලික හවුල්

භුක්තිය කවර ආකාර වුවද ආර්ථික සංගණනයේ වතු නිර්වචනයට අනුව වත්තක් වීම සඳහා වත්තක සියලුම කොටස් **එකම භුක්තියක්** යටතේ විය යුතුය.

**III. ගොවි කාණ්ඩය**

එකම කාරක තත්ත්වයක් යටතේ, කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා සම්පූර්ණව හෝ කොටස් වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සියලුම ගොඩ, මඩ, සතුන්, ජලජීවී වගා කටයුතු සිදුකරන කෘෂිකාර්මික බිම්, **ගොවි කාණ්ඩයක්** වශයෙන් හැඳින්වේ.

**IV. බිම් කැබැල්ල**

ගොවි කාණ්ඩයට අයත් බිම් කොටසක්, එම ගොවිකාණ්ඩයට අයත් නොවූ බිමකින්, ජල මාර්ගයකින්, පාරකින්, කැලෑවකින් සම්පූර්ණයෙන්ම මායිම්වී ඇත්නම් එය **බිම් කැබැල්ලක්** ලෙස හැඳින්වේ.

**ගොවිකාණ්ඩය බිම් කැබලි කිහිපයකින් සමන්විත වන අවස්ථාවකදී වත්තක් ලෙස හඳුනාගන්නා ආකාරය පැහැදිලි කරගැනීම සඳහා උප කොටස යන්න හඳුනාගත යුතුය.**

## 2.18 "උපකොටස" අර්ථ දැක්වීම

විශාල ගොවි කාණ්ඩයක්, ගොවි කාණ්ඩයේ පරිපාලන පහසුව සඳහා කොටස් කිහිපයකට වෙන්කොට එම කොටස් වෙන වෙනම නම්කර ඇති අවස්ථාවකදී එලෙස නම් කරන ලද කොටස් "උපකොටස්" (Sub Division) ලෙස හැඳින්වේ. මෙම උපකොටස්වල එකතුව වත්තක් වන අතර වත්තක උපකොටස් එකිනෙකට යාබදව මෙන්ම එකිනෙකට ඈත්වද පිහිටිය හැකිය. උපකොටස් කෙලෙස පිහිටියද උපකොටස්වල විශේෂ ලක්ෂණය වනුයේ ඊට අදාල පරිපාලන කටයුතු නිශ්චිත එක් ස්ථානයකින් සිදු වීමයි.

ගොවි කාණ්ඩයක් බිම් කැබලි කිහිපයකින් සමන්විත වන අවස්ථාවකදී එම බිම් කැබලි එකිනෙකට යාබද නොවන අයුරින් පිහිටිය හැක. එවැනි අවස්ථාවක එම කැබලි අතර අක්කර 20ට වැඩි කැබලි මෙන්ම අක්කර 20ට අඩු කැබලිද තිබිය හැක. මෙම කැබලි උපකොටස් ලෙස වෙන්කොට ඇත්නම් පමණක් ඒ අතර ඇති අක්කර 20ට අඩු කැබලිද වතු ගණයට අයත් වන අතර උපකොටස් ලෙස නම්කර නොමැති නම් වතු ගණයට අයත් නොවේ.